**අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාර අරමුදල - 2017**

----------------------------------------------------------------------

අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාර අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2007 ජූලි 17 දිනැති අරමුදලේ භාර ඔප්පුවේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම.**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.
එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,035,148 ක ඌනතාවයක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,258,943 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,294,091 ක පිරිහීමක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ යටිතල පහසුකම් නඩත්තු වියදම රු.12,148,112 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 4.1 කාර්යසාධනය

---------------

#### 4.1.1 සැලසුම් කිරීම

-----------------

සමාලෝචිත වර්ෂයේ අරමුදලේ අරමුණු හා ඉලක්ක ලගාකර ගැනීම සඳහා පිළියෙල කරන ලද රු.10,000,000 ක් වූ මුල් අයවැය ඇස්තමේන්තුව හා ඊට අදාල ක්‍රියාකාරී සැලැස්ම 2016 ජූනි 06 දින පිළියෙල කර තිබූ අතර, රු.19,689,000 ක් වූ සංශෝධිත අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණේ 2017 දෙසැම්බර් 29 දින දීය. තවද ක්‍රියාකාරී සැලැස්ම තුළ කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය විගණනයට ඉදිරිපත් නොවීය.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේදී අධිකරණ කළාපයන්හී යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් කර්ය සඳහා මූලධන වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් අධිකරණ පරිපාලන ශීර්ෂය මගින් රු.130,000,000 ක් ප්‍රතිපාදනය කර ඉන් රු.128,896,325 ක් ගෘහ භාණ්ඩ හා කර්යාල උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් වැයකර තිබුණි. එසේ තිබියදීත් අරමුදලේ භාරකාර ඔප්පුවේ 1 (A) වගන්තිය අනුව වූ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් අධිකරණ අමාත්‍යාංශය විසින් අරමුදල වෙත ලැබී තිබූ රු.10,000,000 ක් සහ අරමුදලේ වෙනත් ආදායම් භාවිතා කර මූලධන වත්කම් අත්පත් කරගැනීම වෙනුවෙන් පමණක් රු.15,723,208 ක් වැයකර තිබුණි. එහෙත් අරමුදලේ භාරකාර ඔප්පුවේ 1 (A) වගන්තියේ සඳහන් අනෙකුත් අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් අවධානය යොමු වී නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 5.1 අයවැය පාලනය

--------------------

2017 වර්ෂයේ සංශෝධිත අයවැය ලේඛනය අනුව වර්ෂයේ ඇස්තමේන්තුගත, වියදම යටතේ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම්වල සියයට 17 ක හා පරිපාලන වියදම් යටතේ සියයට 19 ක ඉතිරියක් පවතීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී  කලමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයා වෙත යොමු කරන ලද අතර, අරමුදලේ කාර්යයන් පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබීම පිළිබඳව අවධානය යොමු කල යුතුව පවතී.